රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 12/98

මගේ අංකය :-II/719ඊ21/(I)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998 අප්‍රේල් 03 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් ලෙස සේවය**
**<u>කිරීම සඳහා ගෙවීම</u>**

1994.02.08 දිනැති අංක 9/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් අනුමත කරන ලද ගෙවීම් පහත සඳහන් අයුරින් 1998.01.01 දින සිට සංශෝධනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | මාණ්ඩලික ශ්‍රේණි තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම. | එක් පුද්ගලයකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 20.00 (රුපියල් විස්ස) |
| II. | මාණ්ඩලික ශ්‍රේණි ඇතුළත, ශ්‍රේණියක සිට ශ්‍රේණියකට උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම. | එක් පුද්ගලයකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 15.00 (රුපියල් පහළව) |
| III. | මාණ්ඩලික නොවන ශ්‍රේණියේ තනතුරකට සුදුස්සන් තෝරා ගැනීම සඳහා හෝ මාණ්ඩලික නොවන ශ්‍රේණිය ඇතුළත උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස පවත්වන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම. | එක් පුද්ගලයකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 7.50 (රුපියල් හතයි ශත පනහයි) |
| IV. | කනිෂ්ඨ සේවක ශ්‍රේණියේ තනතුරකට සුදුස්සන් පත් කිරීම සඳහා හෝ කනිෂ්ඨ සේවක ශ්‍රේණියේ ඇතුළත උසස් කිරීම සඳහා සුදුස්සන් තෝරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක සෑම සාමාජිකයෙකුටම. | එක් පුද්ගලයකු සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම වෙනුවෙන් රු. 3.00 (රුපියල් තුනයි) |

02. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අ.කලෝ/(ඩික්සන් නිලවීර)
වැඩබලන ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය